සබරගමු නර්තන සම්ප්‍රදාය.

**Covid – 19 සති පාසල (සබරගමුව)**

කාර්යය පත්‍රිකාව

නර්තනය - 9 ශ්‍රේණිය

11- වාරය

ජූනි මාසය පළමුවන සතිය, (ජූනි 01 සිට ජූනි 05 දක්වා කාලය)

නිපුණතා මට්ටම : නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

ක්‍රියාකාරකම : වන්නම් ගයමින් නටමු. ( කදම්භ පක්ෂි වන්නම)

- **මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.**

පළමු පියවර : ඔබ 8 ශ්‍රේණියේ දි උගත් කදම්භ පක්ෂි වන්නමේ බෙර පදය තාල තබන්න.

දෙවන පියවර : එම තාල රූපයටම වන්නමේ තානම හා කවි ගායනා කරන්න.

තුන්වන පියවර : දැන් එම කවි ගායනා කරමින් වන්නම නර්තනය කරන්න.

හතරවන පියවර : මෙම වන්නමට අදාල කලාසම හා අඩව්ව තාල තැබීමට උත්සාහ කරන්න. (පාඩම් කරන්න)

තාල රූපය : මාත්‍රා 3 තනි තිත (මැදුම් තනි තිත)

දවුල් පදය : ජිං ගතත් ගතත් ගතකුද
ජිංත ජිං තරිකිට ජිං තරිකිට තක

තානම : තම්දනත් තනත් තන තම් දන තානා තනෙන
තෙයි තනත් තනත් තන තම් දන තා- නා

කවිය : වත් පසත් ලෙසින් බබළන මෙන් නා - නා ලිය
ගත් කැළුම් නොමින් නිබදව විහිදීමා
සිත් තොසින් ගොසින් ගිරි කුළ ගොස් යානා වෙත
පත් වෙමින් ගොසින් විල් අසලක සේමා

සිත් තොසින් පසන් කොවුලිඳු රුක් සෙවණැලි තුළ
ගත් තුඩින් නෙළා පල රස වැලදීමා
මෙත් සිතින් අසන් වියතුනි දෙසවන් දී
මෙම කදම්බ පක්ෂි වන්නම රඟ මෙහෙමා

කලාසම - ජිංත කුකුඳ තා තකට
ජිංත කුකුඳ තා තකට
ජිංත කුකුඳ ගතිත කුකුඳ
ජිංත කුකුඳ තා ගතත්.

අඩව්ව - ජෙංත තකට දිරිකිට තරිකිට ගතත් ගත කුද ගත ගතත්
ජෙජෙං තත් කිත්තත් කිතත් ජෙජෙං තා
කුන්දත්තරිකිට ගතත් කුකුඳ තා

සැකසීම - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලීය
සෞන්දර්ය අංශය වෙනුවෙන්,
එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා,
රඹුක මහා විද්‍යාලය,
පොතුපිටිය, කලවාන.
voice - 0719227246